BRITISH COUNCIL | 70 YEARS IN SRI LANKA


# ශ්‍රී ලංකාවේ නිර්මාණාත්මක සහ සංස්කෘතික කර්මාන්ත ක්ෂේත්‍රය.




# පටුන

- වාර්තා මගින් සොයාගත් දත්ත ඉදිරිපත් කිරීම
- දිලිනි හිරිමුතුගොඩ සහ අන්නමාරි ද සිල්වා සමගින් ප්‍රශ්න සහ පිළිතුරු අවස්ථාව
- ප්‍රධාන දේශනය - John Newbigin
- සංවාද මණ්ඩපය - සෙලින් පීරිස්, Linda Speldewinde, අනුෂ්කා විජේසිංහ
- නිගමනය සහ ඉදිරි වැඩපිළිවෙල
- ස්තූතිය සහ අවසානය.

# ශ්‍රී ලංකාවේ නිර්මාණශීලි සහ සංස්කෘතික කර්මාන්ත ක්ෂේත්‍රය.



The batik ceiling designed by Ena de Silva and her son Anil Gamini Jayasuriya for the entrance hall of the Bentota Beach Hotel (1967 and 2020). © Dominic Sansoni.

- ශ්‍රී ලංකාවේ නිර්මාණශීලි කර්මාන්ත ක්ෂේත්‍රය සහ සංස්කෘතික කර්මාන්ත ක්ෂේත්‍රයන්හි වර්තමාන තත්වය පිලිබඳ මූලික අධ්‍යයනයක්.

- නිර්මාණශීලි කර්මාන්ත ක්ෂේත්‍රය ගෝලීයව සීඝ්‍රයෙන් වර්ධනය වෙමින් පවතින අවස්ථාවක, එහි වර්තමාන තත්වය සහ අභියෝගයන් පිළිබඳ හඳුනා ගැනීමේ පළමු පියවර.

- සංස්කෘතික සහ නිර්මාණාත්මක කර්මාන්ත ක්ෂේත්‍රයන් එහි නියැලෙන්නන්ගේ කුසලතාවන් සහ හැකියා මත පදනම් වන්නක්. ඒවායින් නව රැකියා අවස්ථා උත්පාදනය කරගැනීමට සහ ඔවුන්ගේ බුද්ධිමය දේපළ වලින් උපරිම ප්‍රයෝජන ලබාගැනීමට මගපාදා දීම.

# මේ වාර්ථාවෙන් ආවරණය කෙරෙන ක්ෂේත්‍ර මොනවද..?



Preparing the warp to be set into the handloom for weaving, Wayamba province, 2017.
© Selyn Sri Lanka.

- සිංගප්පූරු ක්‍රමවේදය මත  පදනම් වුන ප්‍රදේශ අපි මේ වාතර්ාවෙන් හඳුනා ගෙන තිබෙනවා.

- කලාව සහ සංස්කෘතික - වයාරූපකරණය, දෘශ්‍යකලා ක්ෂේත්‍රය, ප්‍රසාංගික කලාව, උරුමය සහ ශිල්පක්‍රම
  නව නිමර්ාණ - මෘදුකාංග, වෙළඳ ප්‍රචාරණය සහ සන්නාම ප්‍රවධර්නය, ගෘහ නිමර්ාණ ශිල්පය, ගෘහ අලංකරණ ශිල්පය, කාමරීක නිමර්ාණකරණය, ඇඳුම් නිමර්ාණ ශිල්පය.

- මාධ්‍ය - ප්‍රකාශන, ගුවන්විදුලි සහ රූපවාහිනී, ඩිජිටල් මාධ්‍ය (නව මාධ්‍ය), චිත්‍රපට සහ වීඩියෝ
  එමෙන්ම ආයුවෙර්දය, රූපලාවන්‍ය සහ ආහාර සැකසීමේ කලාව ගැනත් අපේ සමීක්ෂණ සිදුකෙරුනා.

# සමීක්ෂණයට ප්‍රවේශය සහ භාවිත කළ ක්‍රමවේදය



- මේ සඳහා ක්‍රමවේද කිහිපයක් භාවිතා කළා. ඒ අතර,
  ජනලේඛන හා සංඛ්‍යාලේකන දෙපාතර්මේන්තුවේ ඇති කම්කරු ප්‍රජාව පිලිබඳ දත්ත විශ්ලේෂණය කිරීම.

- පළාත් හතකින් තෝරාගත් නිර්මාණශීලි කර්මාන්ත ක්ෂේත්‍රයේ නියැලෙන පිරිස 492ක් සමග සිදුකළ සමීක්ෂණයේ දත්ත විශ්ලේෂණය

- ඉලක්කගත කණ්ඩායම් 8ක් සමග සාකච්චා කිරීම. කණ්ඩායම් 8කට සාමාජිකයින් 72ක් ඇතුළත් වී තිබුනා.
  ප්‍රධාන සම්මුඛ සාකච්ඡ 40ක් සිදුකිරීම.

- මේ සඳහා නිර්මාණශීලි කර්මාන්ත ක්ෂේත්‍රය නියෝජනය කරන පුද්ගලයින් සහ සාමාන්‍ය පුද්ගලයින් 12 දෙනෙකුගෙන් යුත් කමිටුවක් මේ සඳහා සහයෝගිතා දායකත්වය දැක්වුවා.



*Academy of Design international awardwinning alumnus Amesh Wijesekera showcases at Berlin Fashion Week, January 2019.*
*© Mercedes-Benz Fashion Week, Berlin, 2019.*

# ශ්‍රී ලංකාවේ ආර්ථිකයට වඩා වටිනාකම් එක්කරන ක්ෂේත්‍රයන් මොනවාද..?



Thaji, principal dancer, Chitrasena Dance Company, performs in Samhara, 2017.
© Luxshmanan Nadaraja.

- ශ්‍රී ලංකාවේ නිර්මාණශීලි කර්මාන්ත ආර්ථිකය 2010 සහ 2014 අතරතුර කාලයේ ස්ථාවර වර්ධනයක් පෙන්වා තිබෙනවා.

- ඇමරිකානු ඩොලර් මිලියන 433.62 සිට ඇ.ඩො. මිලියන 845.41ක් දක්වා අගයක් දළ දේශීය නිෂ්පාදනයට එක්කිරීමට එම ක්ෂේත්‍රයන් සමත්ව තිබෙනවා.

- භාණ්ඩ හා සේවා අපනයන අගයන් ගණනය කිරීමේදී එය 95%ක වර්ධනයක් බව පෙනී යනවා.

- නමුත් අධික ආනයනයන්, අදාළ කාලය තුළම ආර්ථිකයේ අසමතුලිතතාවන් ඇතිකිරීමට සමත්ව තිබෙනවා.

- දළ දේශීය නිෂ්පාදනයට මෙම කර්මාන්ත ක්ෂේත්‍රයන් මගින් එක්වන අගය (භාණ්ඩ හා සේවා අපනයනයන පිලිබඳ ගණනය කිරීම් අනුව) 1.06%ක් පමණක් වන්නේ ඉහත හේතුව නිසාමයි.


# සේවා නියුක්ති අංශය කෙතරම් වැදගත්ද..?



*The Hatch Works branded entrance to the reconfigured colonial era tea agency, opened in 2019. © Menika van der Poorten.*

- ශ්‍රම බලකායෙන් ආසන්න වශයන් 3% (2.9%) පමණක් මේ නිර්මාණශීලි කර්මාන්ත ක්ෂේත්‍රය නියෝජනය කරනවා.
- ඒ ප්‍රමාණයෙන් 36%ක් කාන්තාවන් වන අතර, 67%ක්ම වයස අවු. 24ත් 55ත් අතර අය වනවා.
- 71%ක් වූ අති බහුතරය පෞද්ගලික අංශයේ කටයුතු කරමින් බදු ගෙවමින් රාජ්‍යයට ආදායම් උත්පාදනය කර දෙන්නන්.
- බුද්ධිමය දේපළ අයිතීන් පිළිබඳව දැනුවත් ප්‍රමාණය ඉතා අවම වන අතරම, බුද්ධිමය දේපළ සඳහා රැකවරණයක් සහිත ප්‍රමාණය 8.8%ක් පමණක් වනවා.
- මේ ප්‍රමාණය ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකායේ ඉහළ අධ්‍යාපන සුදුසුකම් සහිත සහ පහළ මට්ටමේ සුදුසුකම් සහිත යන අන්ත දෙකටම අයත් වනවා.

# වැටුප් සහ ආදායම්



Graduation Ceremony
Military Technical College,
Muscat, Oman, 2015.
© Cyber Illusions.

- නිර්මාණශීලි කර්මාන්ත ක්ෂේත්‍රයේ සේවය කරන්නකුගේ මධ්‍යනා්‍ය මාසික වේතනය LKR 29,418 (US$192.40) ගණනය කෙරෙනවා. එය ජාතික මධ්‍යනා්‍ය වැටුප් අගය වන LKR 33,894 (US$221.70)ක ප්‍රමාණයට වඩා පහළ අගයක් වනවා.

- අඩුවෙන් ආදායම් ලබන අංශ එනම්, ශිල්පීය ක්‍රම, නිෂ්පාදන, ග්‍රැෆික් නිර්මාණ, විලාසිතා නිර්මාණ ආදිය හැර අනිකුත් ක්ෂේත්‍ර වල සාමාන්‍ය මාසික ඉපයීම LKR 40,000 (US$261.60) ට වඩා වැඩි අගයක් වනවා.

- තොරතුරු තාක්ෂණ, නිර්මාණ, ප්‍රචාරණ වැනි අංශ වල නියැලෙන අවු. 45ට අඩු තරුණ ජනගහණය 75%කට වැඩි ප්‍රමාණයකට කීතරීමත් නාගරික සමාගම් වල ඉහළ ආදායම් ලැබීමේ හැකියාවක් සහිත වනවා.

- විවිධ ශිල්ප ක්‍රම මගින් කෙරෙන නිෂ්පාදනයන් තරුණ පිරිස් අතර අඩු අවධානයකට ලක්ව තිබෙන්නේ අඩු වැඩකිරීමේ පහසුකම් සහ අඩු වැටුප් / ආදායම් ලැබීමේ තත්වය හේතුවෙනුයි.

# අතුරු කාරණා පිලිබඳ විශ්ලේෂණය - ප්‍රධාන කරුණු කිහිපයක්



Jetwing Vil Uyana Hotel and environment, designed by Sunela Jayawardena, open since 2006. © Jetwing Hotels.

- ජාත්‍යන්තර මට්ටමේ චිත්‍රපට නිෂ්පාදන වැනි දෑ සඳහා ශ්‍රී ලංකාව සතු මනරම් දශර්න තල වැනි දේ සැපයීමේ සේවාවන් සඳහා වැඩි ඉඩකඩක් පවතිනවා.
- සිංහල, දෙමළ, සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම online සාහිත්‍යයට වැඩි වටිනාකමක් එක්ව තිබෙනවා. කවි, කෙටි කතා සහ දිගු නවකතා වැනි නිමර්ාණ වලින් මේ ඩිජිටල් අවකාශයන් පරිපූණර්ව තිබෙනවා.
- ශිල්පීය නිමර්ාණ අංශය සංස්කෘතිකමය වශයෙන් වැඩි වටිනාකමක් සහිත වුවත් වාණිජමය අතින් ඉහලට ගොස් නොමැති අතර මේ මොහොතේ ඒ සඳහාද වැඩි ඉඩක් වෙන්කර ගැනීමට හැකිය.
- ශ්‍රී ලංකාව අවට රටවල උපාධිධාරීන් තමන්ගේ පශ්චාත් උපාධි උසස් අධ්‍යාපන කටයුතු සඳහා මෙන්ම ගෘහ නිමර්ාණ ශිල්පය වැනි විෂයන්හි ආධුනිකත්ව පුහුණුව සඳහාද තෝරා ගැනීමේ ඉඩකඩක් පවතිනවා.

# අභියෝග අතරින් කිහිපයක්




Baliphonics – contemporary western improvisation meets the ecstatic and transcendental healing ritual of Bali.
© Shehan Obeysekera.

- ප්‍රසාංගික හා දෘශ්‍ය කලා ශිල්පයන් ලංකාවේ දෛනික ජන ජීවිතයේම කොටසක් ලෙස පැවතියත් වෘත්තිමය මට්ටමින් වර්ධනය වී නොමැති තත්වයක් සහ තරුණ පරපුර එය වෘත්තීය වශයෙන් තෝරා ගැනීමට පසුබට වීමේ තත්වයක් පවතිනවා.

- නිර්මාණ මංකොල්ලය සහ බුද්ධිමය දේපළ සොරකම් කිරීම බහුල වශයෙන් සිදුවනවා. චායාරූප ශිල්පීන්ගේ නිර්මාණ කිසිදු අවසරයකින් තොරව ප්‍රතිනිර්මාණය කරමින් භාවිතා කිරීම සුලභ උදාහරණයක්. ප්‍රධාන ධාරාවේ මාධ්‍ය පවා මේ අකටයුත්තේ යෙදෙනු දැකිය හැකියි. මෙම අංශය වෙනුවෙන් නිසි නීතිමය තත්වයන් ක්‍රියාත්මක නොවීම ගැටළුවකි.

- ශිල්පීය නිෂ්පාදනයන් සඳහා වන අමුද්‍රව්‍ය මිළ ඉහළ යාම, ඒවා සපයා ගැනීමේ අපහසුතාව, නිෂ්පාදන පිරිවැය අධික වීම ආදිය මිළකරණයට බලපානවා. ඒ හේතුවෙන් වෙළඳපොල සපයා ගැනීමේදී නිෂ්පාදකයින්ට දැඩි දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදුවනවා.

# නිගමන සහ යෝජනා




*Body Earth – Earth Body, 2015. Mixed media on paper, 64cm x 47cm by Anoma. This work was shown in the exhibition EarthLines, 2016, Galle. Conceptualised as a response to the historic 2015 UN climate change convention in Paris, the works in EarthLines depicted the precarious fluidity of the earth's delicate ecosystem, under attack. Private collection, Colombo. www.anomawijewardene.com*

- ශ්‍රී ලංකාවේ නිර්මාණශීලි කර්මාන්ත ක්ෂේත්‍රයට සැලකියයුතු අවස්තාවන් පවතිනවා.
- ශ්‍රී ලංකාව සදාචාරාත්මක සහ තිරසාර නිර්මාණශීලි සේවා සපයන ඒකකයක් ලෙස සංවධර්නය කළ යුතුයි.
- ගෝලීය වටිනාකම් මෙරට නිෂ්පාදන ක්ෂේත්‍රයන් වෙත ලබාගැනීමට කටයුතු කළ යුතුයි.
- සංස්කෘතික සහ නිර්මාණශීලි කර්මාන්ත ක්ෂේත්‍රය පිලිබඳ තොරතුරු වැඩි වැඩියෙන් ව්‍යාප්ත කළ යුතුයි.
- මෙම ක්ෂේත්‍රයන් සඳහා ප්‍රභල වෘත්තීය මට්ටමේ සංවිධානයන් ඇතිකළ යුතුයි.
- බුද්ධිමය දේපළ පිළිබඳව වන නීති බලාත්මක කිරීම සහ ඒවා පිලිබඳ දනුවත්බව වැඩි කිරීමට කටයුතු කළ යුතුයි.
- නිර්මාණශීලි කර්මාන්ත ක්ෂේත්‍රයන් පිලිබඳ අධ්‍යාපනය වැඩිදියුණු කිරීමත්, ඒවාට හිමිවිය යුතු නිසි වටිනාකම් ලබාදීමට කටයුතු කිරීමත් කළ යුතුයි.

BRITISH COUNCIL | 70 YEARS IN SRI LANKA

# Creative and cultural industries in Sri Lanka

www.britishcouncil.org